**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 02/2009**

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

මගේ අංකය: EST-4/SESSI/03/0301
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ 07
**2009.02.06**

**<u>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් බඳවාගැනීමේ පරිපාටිවලට ඇතුලත් කිරීම.</u>**

රජයේ සේවයේ තනතුරුවලට බඳවාගැනීමේදී අදාල බඳවාගැනීමේ පරිපාටිවල ජාතික වෘත්තීය සුදුසුකම්ද ඇතුලත් කරන ලෙස වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය මගින් ඉල්ලීමක් කර ඇත.

**02.** මේ පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අදාල රාජ්‍ය ආයතනවල එකගත්වය මත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික, පහත සඳහන් වැටුප් පරිමාණයන් නියම කර ඇති තනතුරු වලට අදාල බඳවාගැනීමේ පරිපාටිවල දැනට ඇතුලත් සුදුසුකම් වලට විකල්ප සුදුසුකම් වශයෙන් පිළිගැනීමට නිර්දේශ කර ඇත.

| අනු අංකය | ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම | රාජ්‍ය සේවය සඳහා අදාල සේවක ගණය හා වැටුප් කේත අංකය |
|---|---|---|
| 01. | 1 වන මට්ටම (NVQ 1) | ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන<br>PL - 1 - 2006 |
| 02. | 2 වන මට්ටම (NVQ2) හෝ<br>3 වන මට්ටම (NVQ 3) | ප්‍රාථමික ශ්‍රේණිය – අර්ධ ශිල්පීය<br>PL - 2 - 2006 |
| 03. | 4 වන මට්ටම (NVQ 4) | ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය<br>PL - 3 - 2006 |
| 04. | 5 වන මට්ටම (NVQ 5) | කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ-3<br>MT - 1 - 2006 |
| 05. | 6 වන මට්ටම (NVQ 6) | කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ-2<br>MT – 2 - 2006 |

**03.** ඉහත 2 වන ජේදයේ සඳහන් වැටුප් පරිමාණයන් නියම කර ඇති තනතුරුවල කාර්යය භාරය සැලකිල්ලට ගෙන සුදුසුකම් ලෙස අදාල වෘත්තීන්හි හෝ විෂය ක්ෂේත්‍රයන්හි ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම්ද ඇතුලත් කිරීමට සුදුසු පියවර ගන්නේ නම් මැනවි.

**04.** ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් ලිපිනයෙන් විමසීම මැනවි.

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
නිපුණතා පියස, 354/2
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

**විද්‍යුත් තැපැල** : info@ tvec.gov.lk
**අන්තර් ජාලය** : www.tvec.gov.lk

**05.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.



ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය